**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

## මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

# පුරප්පාඩු

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- **සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) – තනතුරු – 01**
- **පර්යේෂණ නිලධාරී – තනතුරු – 02**

පුරප්පාඩු තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ සුදුසුකම් හා ආදර්ශ අයදුම්පත්‍රය www.nhrdc.gov.lk වෙබ් අඩවිය තුළ දක්වා ඇත. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව, නො. 354/2, නිපුණතා පියස, 7 වන මහල, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 ලිපිනයට 2018/10/25 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, සුදුසුකම් දක්වෙන සහතික වල ඡායා පිටපත් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කරන්න.

**සභාපති,**
**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව,**
**නො 354/2, නිපුණතා පියස,**
**7 වන මහල, ඇල්විටිගල මාවත,**
**නාරාහේන්පිට, කොළඹ 05**
**දුරකථන අංකය : 0113-443169**

## Vacancies

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පහත සදහන් ඇබෑර්තු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **<u>සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර</u>**

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

**බාහිර අයදුම්කරුවන්:**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ, ගණකාධිකරණය, මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය හෝ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධියක්,
2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL)/ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CIMA) (UK) / වරලත් සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ACCA) (UK)/ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA) (SL) බලපත්‍රලාභී/අන්තර් මාධ්‍ය මට්ටම.

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් වසරක පූර්ව යෝග්‍යතා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

1. බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබාගෙන තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි කණිෂ්ඨ කළමනාකරණ (JM)) වර්ගයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :-**

MM 1-1-2016

රු.53,175/= -10X 1,375 – 15 X 1,910-95,575/=

(ආරම්භක වැටුප් පියවර - 2018 රු. 42,161/=)

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි)

**වයස් සීමාව :-** අවුරුදු 22- 45 (ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ)

## Vacancies

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි පහත සඳහන් පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>පර්යේෂණ නිලධාරී තනතුර – තනතුරු 02</u>**

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින්: ( පහත 1 හෝ 2 හෝ 3 )**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගත් ආර්ථික විද්‍යාව / සංඛ්‍යානය / ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය / තොරතුරු තාක්ෂණ / සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක්
2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යාව / සංඛ්‍යානය / ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය / තොරතුරු තාක්ෂණ / සමාජ විද්‍යාව පිළිබඳ සාමාන්‍ය උපාධියක් සමඟින් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්
3. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක සහාය සාමාජිකත්වය.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (පහත 1 හෝ 2)**

1. බාහිර අයදුම්කරුවන් විසින් අවශ්‍ය කරනු ලබන සුදුසුකම් සපුරා ගෙන තිබීම
2. තනතුරුට අදාළ විෂයය ක්ෂේත්‍රයෙහි "මෙහෙයුම් / උපෙද්ශක" (MA 4) හෝ "බලාත්මක කිරීම /මෙහෙයුම් / ව්‍යාප්තිය" (MA 4) කාණ්ඩයේ අධ්‍යයන / පර්යේෂණ ක්‍රියාකාරකම් සම්බන්ධ තනතුරක වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. **වැටුප් පරිමාණය:** (AR 1-II)

රු. (51, 285- 5 x 1,135 -5 x1, 335 -15x 1,590- 87,485)

(මූලික වැටුප් පියවර – 2018 රු.40, 661 /=)

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක.02/2016 ප්‍රකාරව)

**වයස සීමාව:** අවුරුදු 22 – 45. (අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)